Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2022), Vol. 07 (01)

# A Criminological Study on the Requirement to Introduce the Criminal Law into the Junior Secondary School Syllabus (Grades 6 to 9) in Sri Lanka (Based on *Mahiyanganaya* Education Zone)

A. M. H. P. Madhusanka* and H. P. K. N. Hewawasam

Department of Criminology and Criminal Justice, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 17 Aug 2021
Accepted 13 Nov 2021
Issue Published Online
01 January 2022

**Key Words:**
Legal Literacy
Education
Legal Education
School Syllabus
Criminal Law

*Corresponding author
E-mail address:
hashantha1995@gmail.com

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v07i01.10

VJHSS (2022), Vol. 07 (01), pp. 162-176

ISSN 1391-1937
ISSN 2651-0367 (Online)

©Faculty of Humanities and Social Sciences 2022

**ABSTRACT**

*In light of the present society infested with crimes, it is a timely need that the community be empowered with legal literacy to succeed in controlling and preventing crimes. Hence, while investigating its practicality, this study intends to identify the need for criminal law to be included in Sri Lanka's junior secondary school syllabus (Grades 6 to 9: 11 to 14-year age group). Twelve out of eighty-one schools in Mahiyanganaya Educational Zone have been selected using the stratified sampling method for the study. Sixty responders were chosen to represent every school in the sample, and data were collected through a questionnaire, which was analysed using SPSS software. The study revealed that in controlling and preventing crimes, improving the legal literacy of the whole community plays a crucial role. It was established that school-level education should be prioritized to enhance legal literacy, build childhood personality, and overcome legal illiteracy. In this regard, 95% of the participants agreed that the junior secondary school syllabuses should be updated so that criminal law is integrated into the school syllabus as a subject. The study recommends properly identifying junior secondary school syllabuses and upgrading their expected learning outcomes through a committee of specialists. Psychological and technical aspects must be incorporated in reforming the syllabuses. It is recommended that for the subject content to be delivered practically, highly qualified personnel should be recruited as teachers to make this effort more productive.*

**මාතෘකාව**

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියේ කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල (6 සිට 9 ශ්‍රේණිය දක්වා) විෂය නිර්දේශය සඳහා අපරාධ නීතිය විෂයක් ලෙසට ඇතුළත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක් (මහියංගණය අධ්‍යාපන කලාපය ඇසුරින්).

## 1. හැඳින්වීම

අපරාධ, සෑම සමාජයක් තුළින් ම විද්‍යමාන වන්නාවූ පොදු සංසිද්ධියකි. එය සමාජ ජීවිතයේ නොවැළැක්විය හැකි සහ සාමාන්‍ය අංගයකි (Durkheim, 1895). විවිධ සමාජ සංස්ථාවන් අපරාධ යන්න විවිධ ආකාරයෙන් විග්‍රහ කරනු ලබයි. එක් සමාජ සංස්ථාවක අපරාධයක් ලෙස සලකනු ලබන මානව චර්යාවක් තවත් සමාජ ක්‍රමයක අපරාධයක් හෝ වරදක් නොවිය හැකිය. අපරාධය තවදුරටත් විස්තර කිරීමේ දී සමාජ විද්‍යා ශබ්ද කෝෂයෙහි නීතියෙන් තහනම් කළ හා දඬුවමකට යටත් කළ ඕනෑම ක්‍රියාවක් අපරාධයක් ලෙසට ද සඳහන් කර ඇත (Bruce & Yearley, 2006). එයින් පැහැදිලි වනුයේ සෑම අපචාරී මානව චර්යාවක් ම අපරාධයක් නොවන බවයි. ඒ බව ඊ. එච්. සදර්ලන්ඩ් විසින් අපරාධය පිළිබඳව කළ විග්‍රහයෙන් ගම්‍යමාන වේ. ඒ අනුව හැසිරීමක වරදකාරී බව දුරාචාරය හෝ අශෝභනත්වය නොසලකා හුදු අපරාධ නීතිය කඩකිරීම අපරාධයක් ලෙස සඳහන් කරයි. මෙහි දී කිසියම් ක්‍රියාවක ආවේණික හෝ සදාචාරමය වටිනාකම අනුව අපරාධය නිර්වචනය නොකළ යුතු බැව් ප්‍රකාශ කරන අතර, යම් නීතියක් යම් ක්‍රියාවක් කොතරම් සදාචාරාත්මක වශයෙන් ආවේණික වුවත් එය අපරාධ නීතියේ විස්තර නොවෙනවා නම් අපරාධයක් ලෙස නොසැලකෙන බැව් කියයි” (Sutherland & Cressey, 1960).

සදර්ලන්ඩ්ගේ එම අදහස තුළ අපරාධ නීතියේ අර්ථ දක්වා නැති නමුත් සමාජයට අගතිගාමී තත්ත්වයන් ඇති කරනු ලබන මානව චර්යාවන් පවතින බව ගැබ්ව ඇත. ඒවා අපගාමී චර්යා හෝ අපචාර ලෙසට නම් කළ හැකිය. මූලිකව බලතහොත් අපචාරය, අපරාධය යන සංකල්පයට වෙනස් තත්ත්වයක් නිරූපණය කරන බවක් හැඟේ. ඍජුවම අපරාධයට නොනැගෙන ඒ සමාජ සම්මතය විසින් විවිධ නිර්ණායකයන් පදනම් කොට පණවා ඇති අනුමැතිය උල්ලංඝනය කරන යම් හැසිරීම් රටාවක් වේ ද එය අපචාරයක් ලෙස අර්ථ දැක්විය හැකිය (Sutherland & Cressey, 1960). අපගාමී චර්යාව පිළිබඳව මෙසේ සඳහන් කළ හැකිය. පුද්ගලයා බාහිර උත්තේජකයන් සඳහා ප්‍රතිචාර දක්වන්නේ සිය පෞරුෂය ගොඩනැගී ඇති ආකාරය අනුව ය. ඇතමුන් අනුන් ද විනාශ කරමින් තමාගේ ජීවිතය ද නැතිකර ගනී. කිසියම් චර්යා රටාවක් සමාජයට හෝ සදාචාර රීති වලට පටහැනි නම් අපගාමී චර්යාවක් ලෙස විග්‍රහ කළ හැකිය (වල්පොල, 2013). එබැවින් අපරාධය හා අපගාමී චර්යා යනු එකිනෙකට වෙනස් සංකල්පයන් බව වටහාගැනීම වැදගත් ය. අපරාධ පාලනය හා නිවාරණය යන්න අපරාධ විද්‍යා විෂයය ක්ෂේත්‍රය තුළ අවධානය යොමු කරන මූලික ක්ෂේත්‍රයකි. අපරාධයක් ඇතිවීමට පෙර ඒවා වලක්වා ගැනීම මෙන් ම අපරාධයක් සිදුවූ පසුව ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය මෙම සංකල්ප ද්විත්වය තුළින් අර්ථ නිරූපණය වේ. කෙසේ වෙතත් මෙම සංකල්ප දෙක වෙන වෙනම වෙන්කොට හඳුනාගැනීම අපහසු වනුයේ එම කාරණා ද්විත්වයේ මුඛ්‍ය අරමුණු අපරාධ අවමට කිරීමට මුල්වන නිසාවෙනි. මේ අනුව නෛතික සාක්ෂරතාව පැවතීම මෙම අපරාධ පාලනය හා නිවාරණය යන කාරණා ද්විත්වයම සාධනය කරන්නකි. නීතිය දැන සිටීම තුළින් ම අපරාධ පාලනය හා නිවාරණය සාක්ෂාත් කරගැනීමේ හැකියාව ඉතා ඉහළ වේ.

නීතිය යනු, “පුද්ගලයෙකුගේ, පුද්ගල කණ්ඩායමකගේ හැසිරීම පාලනය කරන්නා වූ ද, නිශ්චිත සමාජ ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම වළක්වන්නා වූ ද, එය කඩ කරන්නවුන්ට දඬුවම් කිරීම සඳහා ද එය කඩ කිරීම නිසා පීඩාවට පත්වූවන්ට සහන සැලසීම සඳහා වූ ද සංවිධානය වූ සමාජ බලවේගයකි” (හරිස්චන්ද්‍ර, 2013, පිටුව 09). ඒ තුළින් පැහැදිලි වන්නේ නීතිය යනු නෛතික බලය හා බලපෑම යොදන සහ යෙදිය හැකි ආයතන සහිත ඒකකයක් බවය.

මෙම නීතිය හා නෛතික සන්දර්භය තුළ භාවිත වන වචන හා ඒවායේ අදහස තේරුම් ගැනීමත්, එම තේරුම් ගත් නෛතික ක්‍රියාවලිය තුළින් තමා හට අවශ්‍ය ඉදිරි නෛතික කටයුතු සඳහා නීතිය භාවිත කිරීම හා අදාළ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව නෛතික සාක්ෂරතාව වන්නේ ය (කැනේඩියානු නීතිඥ සංගමය, 1992). ඒ අනුව පුද්ගලයාව නෛතික සාක්ෂරතාවයෙන් බලගැන්වීම උදෙසා අධ්‍යාපනය මහත් පිටිවහලක් වේ. නෛතික සාක්ෂරතාව තුළදී අත්‍යන්තයෙන් ම අවධාරණය කළ යුතු කරුණක් ලෙස අපරාධ නීතිය හඳුන්වා දිය හැකිය.

අපරාධ නීතියේ මූලික පරමාර්ථ වනුයේ අපරාධයක් සංයුක්ත වන අංග නිර්වචනය කිරීම, අපරාධයක් සඳහා දිය යුතු දඬුවම් තීරණය කිරීම සහ අපරාධ වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමයි. එමගින් යුක්තිය පිළිබඳ මහජන හැඟීම ස්ථාවර කරයි. එමගින් පොදු සහයෝගීතාව සහතික කිරීම සිදුවේ (Chiao, 2016). ශ්‍රී ලංකා අපරාධ නීතියේ හරයාත්මක අංශය දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් වන විධානවල අඩංගු වී තිබේ. එහි කාර්යය පටිපාටිම නීති අපරාධ නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත වැනි මූලාශ්‍රයන් හි අඩංගු වේ. පොදු පිළිගැනීමට අනුව අපරාධ නීතියේ පරමාර්ථ වන්නේ, පුද්ගලයකුට හෝ මහජන යහපතට, අයුක්ති සහගත ලෙස සහ සමාව දිය නොහැකි ලෙස හානි සිදුකරන වැරදි සහ නීති විරෝධී හැසිරීම් තහනම් කිරීම සහ වැළකීම, දෝෂ සහගත නොවූ හැසිරීම් සාපරාධී යැයි හෙළා දැකීමෙන් වැළැකීම යනාදියයි. එනම් දෝෂ සහගත නොවූ හැසිරීම් සුරැකීම, යම් තැනැත්තකුගේ හැසිරීම් මගින් ඔහු කිසියම් අපරාධයක් කිරීමට සූදානම් වන බව පෙන්නුම් කරන විට එවැන්නකු මහජන නීතියේ පාලනයට යටත් කිරීම, බරපතල සහ සුළු වරදවල්

අතර වෙනස්කම් පැහැදිලි සහ යුක්ති සහගත ලෙස පෙන්නුම් කිරීමයි (ගුණරත්න, 2009).

අධ්‍යාපනය යනු, "ජීවත්වීමේ ක්‍රියාවලියයි" (Education is a process of living). මිනිසා සිය ජීවිත කාලය තුළ දී ලබන අත්දැකීම් ප්‍රයෝජනවත් වන පරිද්දෙන් යළි යළිත් ගොඩ නැංවීම අධ්‍යාපනය යනුවෙන් අදහස් කෙරෙන බව ජෝන් ඩිවී විස්තර කරයි (වීරතුංග, 1981). අධ්‍යාපනය විධිමත් හා අවිධිමත් ලෙසට වන අතර පිලිප් කූම්බස් නම් අධ්‍යාපනඥයාගේ අදහසට අනුව අවිධිමත් අධ්‍යාපනය වනාහී "සෑම දෙනාට ම විවෘත කරන පරිදි පුද්ගලයා දැනුමෙන්, නිර්මාණශීලී බවින් ඉදිරියට යන සුවපහසු මගකි" (සේනාරත්න, 2020). ෆෙඩ්රික් හාබිසන් නම් විද්වතා විසින් විධිමත් අධ්‍යාපනය හඳුන්වා ඇත්තේ "පූර්ව කාලීන පන්ති කාමරට පැමිණීම සහිත, වයස් මට්ටම් අනුව ශ්‍රේණිගත කරන ලද සහතික, ඩිප්ලෝමා සහ උපාධි යනාදිය ලබා ගැනීම කෙරෙහි යොමු වූ අධ්‍යාපන ක්‍රමයක්" ලෙසට යි" (ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ගැටලුව සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, 2015, පිටුව 104-105). මෙම විධිමත් අධ්‍යාපනය තුළ විෂය නිර්දේශයන් හා විෂයමාලාවන් වන අතර පාසල් විෂය නිර්දේශය වනාහී ඉගැන්වීම හා ඉගෙනීම යන ක්‍රියාවලිය මගින් කුමක් ඉටුකරගත යුතු ද යන්න සඳහා කරන ලද සැලසුමක් බව එම්.පී. බ්‍රීන් කියයි. එමෙන් ම විෂය නිර්දේශය පිළිබඳව ක්‍රිස්ටෝපර් කැන්ඩලීන්ගේ අදහස මෙසේ ය. එනම් කුමක් උගත යුතු ද යන්න විස්තර කරන්නක් ලෙස විෂය නිර්දේශය සැළකිය හැකිය යන්නයි. නිතර ම මෙන් ගුරුවරුන් සහ සිසුන් විසින් කළයුතු ක්‍රියාකාරකම් ලෙසට මේවා සකස් කරනු ලැබේ (ජයවීර, 1999). පාසල් විෂය මාලාව යන්නෙහි අර්ථය මීට තරමක් වෙනස් ය. "අපේක්ෂිත ඉගෙනුම් ඵල ලබාදෙන ව්‍යුහගත වැඩ මාලාවක් වෙතින් විෂය පථය තුළ ඉගෙනුම් හා ඉගැන්වීම් පහසුකම් පාසලේ දී සැලසීම පිණිස අරමුණු, අභිමතාර්ථ, අන්තර්ගතය, ඉගෙනුම් ක්‍රමෝපායන්, ඇගයීම හා අත්‍යවශ්‍ය ඉගෙනුම් මූලාශ්‍ර යනාදිය ලබාදෙන පාඨමාලාවකි" (සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය-2, 1999, පිටු 06 -11). ඒ අනුව නීති අධ්‍යාපනය ලෙසට අරුත් ගැන්විය හැකි වන්නේ පුද්ගලයා නෛතික සාක්ෂරතාවයෙන් බලගැන්වීම උදෙසා අධ්‍යාපනය විධිමත් අයුරින් යොදවා ගැනීම ලෙස හඳුන්වා දිය හැකිය.

"ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සඳහා යෝජනා" යන මැයෙන් 2016 වර්ෂයේ දී වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබූ අතර, එහිදී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සඳහන් විග්‍රහ කරනුයේ 06 ශ්‍රේණිය සිට 09 ශ්‍රේණිය දක්වා වූ අධ්‍යාපනය, කනිෂ්ඨ ද්විතීයික ඉගෙනුම් අවධිය වශයෙනි (ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා, 2016). මෙම ශිෂ්‍ය අවධිය සඳහා ඉගෙනුම් කටයුතු සිදු කිරීමේ දී පිළිගත් හා ක්‍රමානුකූල ඉගෙනුම් න්‍යායන් භාවිත කළ හැකිය.

රුසියානු ජාතික කායික විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු වූ අයිවන් පැව්ලොව් (Ivan Pavlov) (1849-1936) විසින් සිය "සම්භාව්‍ය ආරෝපණ න්‍යාය" තුළින් පුද්ගලයා වෙත ආරෝපණය කරනු ලබන ප්‍රබෝධක ප්‍රතිචාර හරහා මිනිස් චර්යාව වෙනස් කළහැකි බව සඳහන් කරයි. එමෙන් ම මෙම න්‍යාය ජේ.බී. වොට්සන් (J. B. Wotson) සහ කොන්ස්ටන්ටයින් බයිකොව් (Konstantin Bykov) නම් විද්වතුන් වැඩි දියුණු කර ඇත. වර්ෂ 1898 දී ඊ.එල්. තොන්ඩයික් (E. L. Thorndike) විසින් "ඉගෙනුම පිළිබඳ චර්යාවාදී එළඹුම" තුළින් පුද්ගලයාට අනියම් ලෙස ලැබෙන උපස්ථම්භනයක් නිසා ප්‍රතිචාර නැවත නැවත ඇතිවන බවයි. ඉගෙනුම පිළිබඳව පර්යේෂණ සිදු කළ බී.එෆ්. ස්කිනර් (B. F. Skinner) නම් විද්‍යාඥයා විසින් සිය ප්‍රකාරක ආරෝපණ න්‍යාය තුළින් පුද්ගලයාගේ බොහෝ චර්යාවන් හුදෙක් ප්‍රබෝධකයන්ට දක්වන සරල ප්‍රතිචාර නොවේ. ඒවා හිතාමතා කරනු ලබන ක්‍රියාවන් ය. ඒවා ප්‍රකාරක නම් වන බව දක්වයි. එඩ්වර්ඩ්.සී. ටොල්මන් (Edward C. Tallman) නම් විද්වතා සිය ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යාය (ගෙස්ටෝල්ට්වාදී න්‍යාය) මගින් දක්වනුයේ ඉගෙනුම් අවස්ථාවක සිදුවන විවිධ සිදුවීම් සංවිධානය කරමින් ඉගෙන ගන්නා තැනැත්තා විසින් මනසෙහි කිසියම් ප්‍රජානන ව්‍යුහයක් ගොඩනගා ගන්නා බවයි. මහාචාර්ය ඇල්බට් බැන්ඩුරා (Albert Bandura), නීල් මිලර් (Neal Miller) සහ ජෝන් ඩොලර්ඩ් (John Dollard) යන අය සමාජ ඉගෙනුම් න්‍යාය තුළින් දක්වනුයේ මිනිසුන් හුදෙක් අභ්‍යන්තර බලවේග වලින් පමණක් පාලනය වන්නන් නොවන බවත්, සමාජ පරිසර සාධක මගින් ඒ ඒ අන්දමට හැසිරීමට නව චර්යා දැක්වීමටත්, මිනිසා යොමු කර ඇති බවයි. (අතුකෝරාල සහ අතුකෝරාල, 2005).

ප්‍රාථමික නීති අධ්‍යාපනය හෙවත් පාසල හරහා ලබාදෙන නීති අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳව පී. ත්‍රිපති හා රිචඩ් සී. මැක්ස්වෙලි ඇතුළු පිරිස විසින් කළ පර්යේෂණයන් හීදී හෙළි වූයේ නෛතික අධ්‍යාපනය සමාජයේ වැදගත් ම ක්ෂේත්‍රයක් පිළිබඳව කෙරෙන අධ්‍යාපනයක් බවයි. තාක්ෂණික අතින් ශීඝ්‍රයෙන් ලෝකය දියුණු වන කාල පරාසයක නීති අධ්‍යාපනය සමාජ ගතකිරීම අධ්‍යාපනඥයින්ගේ වගකීමක් වෙමින් පවතින බව ඔවුහු දක්වති (Tripathi, 1968; Maxwell et al., 1975).

පුද්ගලයාගේ නිපුණතා සංවර්ධනය, පෞරුෂ සංවර්ධනය, කුසලතා සංවර්ධනය, ගැටලු විසඳීමේ හැකියාව, සාරධර්ම ඇගයීමට පෙළඹීම, තර්කන හැකියාව වර්ධනය, අන් අයට ගරු කිරීම, ඉවසීම ප්‍රගුණ කිරීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට පෙළඹීම, ප්‍රජාව වෙනුවෙන් පෙනීසිටීමට පෙළඹීම, විවේචනාත්මක හා ගවේෂණාත්මක චින්තනය ආදිය දියුණු වීම පිණිස නීති අධ්‍යාපනය වැදගත් වන බව

ආකාරය පිළිබඳව තවදුරටත් පර්යේෂණාත්මක කරුණු තුළින් සනාථ වී ඇත (Joninia & Petrauskienė, 2013). එසේම, නීතිය පිළිබඳව ඉගැන්වීමේ වගකීම සියලු ම පාසල් බලධාරීන් වෙත පවතින වගකීමක් බව පැහැදිලි කරුණකි. මේ සම්බන්ධ අදහස් දක්වන පර්යේෂකයින්ට අනුව, " ප්‍රජා නීති අධ්‍යාපනය" යන සංකල්පය සමාජගත වීම තවමත් ප්‍රමාද වීමට මෙම වගකීම නිසිලෙස ඉටුනොවීමට හේතු වී ඇති අතර, ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙළක අවශ්‍යතාවක් පවතින බවත්, නමුත් ඇමරිකා එක්සත් ජනපදය වැනි රාජ්‍යයන්හි විවිධ ප්‍රාන්තවල පාසල් තුළ නීති අධ්‍යාපනය ලබා දීම සිදු වන බවත් කරුණු අනාවරණය කොට ඇත (Economides, 2015). නූතනය වන විට නීති අධ්‍යාපනය ජාත්‍යන්තරීකරණය වී ඇති බව ඊට අදාළ පූර්ව සූදානම වෙනුවෙන් ප්‍රාථමික අධ්‍යාපනය (පාසල් අධ්‍යාපනය) තුළ නීතිය ඉගැන්වීමට කටයුතු සූදානම් විය යුතු ආකාරය පිළිබඳවත් අදහස් ඉදිරිපත් වී ඇත (Kashyap, 2016).

ළමා වියේ සිට හොඳ සාරධර්ම සහිතව අපරාධවලින් වැළකී සිටින ළමා පරපුරක්, ප්‍රජාවක් බිහි කිරීමට අපරාධ නීතිය පාසල් විෂයමාලාවට එකතු කළ යුතු බවත් පුද්ගලයා අපරාධ නීතියට පාසලේ දී නිරාවරණය කිරීම ඉතාම ඵලදායී වේ. ඒ අනුව ජාතික ද්විතීයික පාසල් විෂයමාලාවට අපරාධ නීතිය විෂය ඇතුළත් කරමින් ජාතික අධ්‍යාපන විෂයමාලාව ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසු කාලය එළඹ ඇති ආකාරය පිළිබඳව පර්යේෂකයින්ගේ අවධානය යොමු වී ඇත (Rajamanickam et al., 2019). ඒ අනුව, නෛතික දැනුම යනු පුද්ගලයා හට සමාජය වෙතට අනුකූල වීමට අවශ්‍ය ප්‍රධාන අංගයක් වුවත්, බහුතර ජනතාව විවිධ හේතූන් මත නෛතික සාක්ෂරතාවයේ අවම නිසා පීඩාවට පත්වන බව හඳුනාගෙන ඇත. එබැවින් නීති අධ්‍යාපනය මනාව සමාජ ගතකිරීමට විධිමත් ක්‍රමවේදයක අවශ්‍යතාව නිර්මාණය වී ඇති බව පැහැදිලි කිරිමේ අවශ්‍යතාව පවතී (Rooij, 2020). මේ තුළින් පැහැදිලි වන්නේ උසස් අධ්‍යාපනය යටතේ පමණක් පවතින වර්තමාන නීති අධ්‍යාපනයට අමතරව සමස්ත සමාජයට ම අවශ්‍ය පමණින් නෛතික සාක්ෂරතාව ලබාදීමට ප්‍රාථමික අධ්‍යාපන පද්ධතිය වෙතට අවධානය යොමු කළ යුතු තත්ත්වයක් උද්ගත වී ඇති බවයි.

ශ්‍රී ලංකාව වැනි දියුණුවෙමින් පවතින රාජ්‍යයක අපරාධකාරීත්වය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වන ආකාරය විවිධ ආයතනික හා පරිපාලනමය වාර්තා තුළින් පැහැදිලි වන කරුණකි (Police Annual Report, 2015 – 2020; Prison Annual report, 2016 - 2020). මෙම තත්ත්වය සැබැවින් ම සිදුවන අපරාධමය ක්‍රියාවන් නොවනු ඇත. අපරාධ විද්‍යාවේ විශේෂයෙන් හඳුනාගන්නා වූ නිලීන අපරාධ නැතහොත් සැඟවුණු අපරාධ වශයෙන් වාර්තා නොවන බොහෝ අපරාධ පවතිනු ඇත. මෙම කාරණය අපරාධ විද්‍යාඥයින් මුහුද මැද පවතින අයිස්කන්දක නොපෙනෙන කොටසට ආරෝපණය කොට ඇත (Gottschalk & Gunnesdal, 2018). අපරාධ නිලීන ලෙස පැවතීමටත්, අපරාධ සංඛ්‍යා දත්ත වාර්තාකරණය මෙන් ම ඒවා සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග නොගැනීමට එක් හේතුවක් වශයෙන් හඳුන්වා දිය හැක්කේ නෛතික සාක්ෂරතාවයේ අවම බවයි. තමාට සිදු වී ඇත්තේ අපරාධයක් ද සමාජ විරෝධී චර්යාවක් ද යන්න පිළිබඳ දැනීමට එය අපරාධයක් හා ඊට නියමිත දඬුවමක් පවතින බව දැන සිටීම අපරාධ විද්‍යාත්මක වශයෙන් මෙන් ම සමාජීය වශයෙන් ද වැදගත් වනු ඇත. අපරාධයක් මගින් සිදුවිය හැකි සමාජ පිරිවැය, පුද්ගල පිරිවැය පොදුවේ අවම කොට ගත හැක්කේ එවිටයි. ඒ අනුව නෛතික සාක්ෂරතාව තුළදී අපරාධ නීතිය පිළිබඳ හඳුන්වා දීම තුළින් අපරාධයක් සිදුවීමේ සිට ඒ සඳහා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ දැන සිටීම ඉතා ප්‍රයෝජනවත් වේ. කෙසේ නමුත් සියලු අපරාධයන් සඳහා නෛතික ප්‍රතිපාදනයන් සම්මත කොට ඇති අතර සමාජයක් තුළ, ඒ පිළිබඳව තැකීමකින් තොරව පුද්ගල අපරාධ වර්ධනය වීම ගැටලු සහගතය. නීතිය යන්න රාජ්‍යක සියලු පුරවැසියන් දැන සිටිය යුත්තකි. සියලු පුරවැසියන් තමන් ජීවත්වන සමාජයේ පවතින නීති රීති හොඳින් දන්නේ නම්, ඒවාට ගරු කරන්නේ නම් එම සමාජය තුළ අපරාධ ඇතිවීම සිදු නොවේ.

අපරාධ පාලනය හා නිවාරණ ක්‍රියාවලියේ දී භාවිතය ගැනෙන නීතිය නම් වූ විධිමත් ක්‍රමවේදය සියලු පුරවැසියන් වෙත මනාව සම්ප්‍රේෂණය නොවීම තුළ අපරාධකාරීත්වය වෙතට වන පුද්ගල පෙළඹවීම ධනාත්මක ස්වභාවයක් ගෙන දෙයි. රටක සියලු පුරවැසියන් වෙතට නීතියේ දැනුම ස්පර්ශ විය යුතු කාලපරාසයක් නොපවතී නම් නෛතික සාක්ෂරතාව සමාජයේ සියලු ම සාමාජිකයන් වෙත නොලැබේ. රටක මූලික නීතිය යනු කවරේ ද? එම නීතියට අමතරව ඇති අනෙක් නෛතික ප්‍රතිපාදනයන් මොනවා ද යන්න සියලු පුරවැසියන් දැන සිටීම වැදගත් වේ. දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය ආදී බොහෝ නෛතික ප්‍රතිපාදනයන් ප්‍රකාශයට පත්කොට තිබුණද එම නීතීන් පිළිබඳව මනා අවබෝධයක් ඇත්තේ ඉතා සීමිත පිරිසක් වෙත පමණි. එම තත්ත්වය තුළ සමාජය විසංවිධානකාරී වනවා මෙන් ම රටක සංවර්ධන ක්‍රියාදාමය ද අඩාල වන්නේ ය. එය අපරාධකරුවන් වර්ධනය කරනවා මෙන් ම අපරාධ වින්දිතයින් ද බිහිවීම වේගවත් වනු ඇත. මෙම පිරිස උගත් බුද්ධිමත්යැයි සලකන සමාජයන්වල ද දැකගත හැකිවීම සාමාන්‍ය කරුණකි.

මේ අනුව මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව නීතිය වෙත පුද්ගලයාගේ අනුකූලතාව ඇති කිරීමට අධ්‍යාපනය යොදා ගැනීමේ යෝග්‍යතාව කුමක්ද? යන්නට කේන්ද්‍ර වන අතර එහිදී මූලික වශයෙන් පහත දැක්වෙන පර්යේෂණ ප්‍රශ්න කෙරේ අවධානය යොමු කර ඇත.

1. නෛතික සාක්ෂරතාව, අපරාධ පාලනය හා නිවාරණයට බලපාන්නේ කෙසේද?
2. පාසල් ශිෂ්‍යයින්ට නෛතික සාක්ෂරතාව ලබාදීමේ වාසි හා අවාසි මොනවාද?
3. පුද්ගලයා සංවර්ධනය සඳහා නෛතික සාක්ෂරතාවයේ අවශ්‍යතාව කෙබඳුවේද?
4. නෛතික සාක්ෂරතාව ලබාදිය යුතු ක්ෂේත්‍ර මොනවාද?
5. පුද්ගලයා වෙත නෛතික සාක්ෂරතාවයේ ලබාදිය යුතු ආකාරය මොනවාද?
6. අපරාධ නීතිය ශ්‍රී ලංකාවේ පාසල් විෂය නිර්දේශයට හඳුන්වා දීමේ වැදගත්කම කුමක් ද?
7. ඒ සඳහා සිදුකළ යුතු සංශෝධන හා අනුගමනය කළ යුතු ක්‍රමවේද මොනවාද?

ඒ අනුව මෙම පර්යේෂණය, ශ්‍රී ලංකාවේ කනිෂ්ඨ ද්විතීයික පාසල් විෂය නිර්දේශයට අපරාධ නීතිය විෂයයක් ලෙස ඇතුළත් කිරීමේ අවශ්‍යතාව හඳුනාගැනීම හා ඒ සඳහා සුදුසු ක්‍රමවේදයන් හඳුන්වාදීම යන ප්‍රධාන අරමුණ මුල්කොට ගෙන සිදුවන අතර හා අපරාධ නීතිය පිළිබඳව මහජනතාව තුළ ඇති අවබෝධය අධ්‍යයනය කිරීම, නෛතික සාක්ෂරතාව අවම වීම, අපරාධ ගොදුරුකරණයට හා වින්දිතභාවයට පත්වීමට බලපාන ආකාරය අධ්‍යයනය කිරීම, නෛතික සාක්ෂරතාව ලබාදීමේ ක්‍රමවේද අතර අධ්‍යාපනයේ ඇති වැදගත්කම අවධානය කිරීම යන සෙසු අරමුණු කෙරේ අවධානය යොමු කොට ඇත.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගණය අධ්‍යාපන කලාපය අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදාගන්නා ලදි. එබැවින් මහියංගනය අධ්‍යාපන කලාපයේ විවිධ වර්ගයේ පාසල් (ප්‍රාථමික, කනිෂ්ඨ, මහා විද්‍යාල, මධ්‍ය මහා විද්‍යාල සහ ජාතික පාසල්) 81ක් ($N = 81$) අතරින් 15%ක නියැදියක් සකසා ගන්නා ලදි.

$$(n = N \times 15\%)$$

පර්යේෂණයේ විද්‍යාත්මකභාවය සහ ක්‍රමවත් බව සුරක්ෂා කරගැනීම පිණිස සංගහනයේ සෑම ඒකකයක් ම නියෝජනය වීමේ අවකාශය ඇති සම්භාවිතා නියැදි ක්‍රමයට (Probability Samples) අයත් වන ස්තරායන නියැදි ක්‍රමය (Stratified Sample) ප්‍රධාන වශයෙන් භාවිත කර ඇත.

මෙහි දී පාසල් 12ක් (ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයමින්) පර්යේෂණයට යොදාගත යුතු බවට නිගමනය වූ අතර සංගහනයේ අනු ස්තරයන්ගෙන් නියැදිය සඳහා නියෝජනය කරනු ලබන ප්‍රතිශතය සෙවීම සඳහා

$$p = \frac{\#}{81} \times 100$$

යන සූත්‍රය ද, ($p =$ අනු ස්තරයකින් නියෝජනය කරන ප්‍රතිශතය) සෑම අනු ස්තරයකින් ම නියැදිය නියෝජනය කරනු ලබන ප්‍රමාණය (ගණන) ලබාගැනීම සඳහා

$$P_X = p \times 12$$

යන සූත්‍රය ද භාවිත කරන ලදි. ($P =$ අනු ස්තරයකින් නියෝජනය කරනු ලබන ප්‍රමාණය (ගණන), $X =$ පාසල් වර්ගය, 12 $=$ පාසල් 81න් 15%ක ප්‍රමාණය) අදාළ පාසල් වර්ග අතුරින් නියැදිය සඳහා වන පාසල නාමික ලෙසට තෝරාගැනීම සඳහා ලොතරැයි ක්‍රමය භාවිත කරන ලදි.

තෝරාගත් පාසල් ඇසුරින් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සඳහා දත්ත ලබාගැනීමට සහභාගි කරගනු ලබන්නේ කවුරුන් ද යන්න තෝරාගැනීමට විනිශ්චය නියැදිය යොදාගනු ලැබිණ. ඒ අනුව සෑම පාසලකම විදුහල්පති තුමා/තුමිය, නියෝජ්‍ය විදුහල්පති තුමා/තුමිය, අංශ ප්‍රධාන ගුරුවරයෙක්/ගුරුවරියක්, තවත් ගුරුවරුන් දෙදෙනෙක් යන ලෙසට පුද්ගලයින් 5 දෙනා බැගින් දත්ත දායකයන් 60 දෙනෙකු (5×12=60) තෝරාගත් අතර අදාළ තොරතුරු හා දත්ත ලබාගැනීම සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය භාවිත කරන ලදි.

සපයාගත් ප්‍රාථමික දත්ත ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස විශ්ලේෂණය කළ අතර ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයේ දී සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යානමය මෘදුකාංගය - Statistical Package for the Social Sciences (SPSS) සහ Microsoft Excel මෘදුකාංගය භාවිත කළ අතර SPSS ක්‍රමවේදය යටතේ කේත පොත (Codebook) ක්‍රමවේදය සහ ද්වි මාර්ග වගු (Cross tabulation) යන ක්‍රමවේදයන් භාවිත කරන ලදි. Microsoft Excel මෘදුකාංගය හරහා අදාළ වගු සටහන්, වට ප්‍රස්තාර හා ස්ථම්භ ප්‍රස්තාර නිර්මාණය කර ඇත. දත්ත දායකයන් දැක්වූ හැඟීම්, භාවයන්, සංකල්පනා හෝ අදහස් ආදිය විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය භාවිත කර ඇත.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ජීව දත්ත තොරතුරු

මෙම පර්යේෂණය සඳහා සම්බන්ධ කරගත් දත්ත දායකයන් ස්ත්‍රීන් හා පුරුෂයන් 60 දෙනෙකු වන අතර ඔවුන් 50% බැගින් සමාන අයුරින් පර්යේෂණය සඳහා සම්බන්ධව ඇත. එමෙන් ම මෙම පර්යේෂණය සඳහා භාජනය වූ සියලු ම දත්ත

දායකයින් සිංහල ජාතිකයන් වන අතර ම බෞද්ධාගමිකයන් වන්නේ ය. ඒ සඳහා අධ්‍යයන ප්‍රදේශයේ සුවිශේෂී භාවය බලපා ඇත. මෙම පර්යේෂණයට සම්බන්ධ වූ දත්ත දායකයන් පාසල් ගුරු වෘත්තිකයන් වන අතර ඔවුන්ගේ වෘත්තියෙහි සේවා කාලය විමසා බැලීමේදී වැඩි වශයෙන් ම දත්ත ලබාදීමට සහභාගි වී ඇත්තේ වර්ෂ එක 01-05 අතර සේවයේ නියුතු වූවන් ය. එය ප්‍රතිශතයක් ලෙස ට 28% ක් වන අතර එහි දෙවන ස්ථානය වර්ෂ 11-15 අතර සේවයේ නියුතු වූවන් වේ. එය 26% කි. මෙහි දී අවම වශයෙන් දත්ත ලබාදීම සඳහා සහභාගි වී ඇත්තේ වසර 31 ට වැඩි සේවාකාලයක නියුතු වූවන් ය. එය ප්‍රතිශතයක් ලෙස 1% ක් වේ. මෙම පර්යේෂණයට භාජනය වූ දත්ත දායකයන් අතුරින් 50% ක ප්‍රතිශතයක් උපාධිධාරීන් වේ. එම ප්‍රමාණය මෙහි උපරිම ප්‍රතිශතාත්මක අගය වේ. අවම පිරිස වන්නේ පශ්චාද් උපාධිධාරීන් ය. එනම් 3% ක් පමණි. අධ්‍යයනයට ලක් කරන ලද මෙම පිරිස සම්බන්ධයෙන් ඔවුන්ගේ නෛතික සාක්ෂරතාවයේ දී අපරාධ නීතිය දැනුම පිළිබඳ අවධාරණය කිරීමේ දී හරයාත්මක හා කාර්යය පිටිපාටි නීතිය යනු කුමක්ද? අපරාධ නීතියේ සඳහන් වැරදි හා ඒවාට අදාළ දඬුවම් හා මූලාශ්‍ර මොනවාද? අපරාධ වාර්තාකරණයේ දී සැලකිය යුතු කරුණු මොනවාද? ව්‍යවස්ථාපිත අපරාධ වැරදි මොනවාද? යන කරුණු මුලික කොට ගෙන කරුණු විමසූ අතර ඒ සඳහා සමස්තයක් නියැඳියේ 27%ක් ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ද 58 % වු ප්‍රමාණයකට මේ සම්බන්ධයෙන් සාමාන්‍ය දැනීමක් පැවතුණි. නියැදියේ 15% ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර නොදක්වන ලදි.

### 3.2 නෛතික සාක්ෂරතාව, අපරාධ පාලනය හා නිවාරණයට බලපාන ආකාරය

අපරාධ පාලනය හා නිවාරණය සහ නෛතික සාක්ෂරතාව අතර අන්තර් සම්බන්ධතාව විමසීමේ දී 40%ක දත්ත දායකයින් අපරාධ පාලනය හා නිවාරණයත් නෛතික සාක්ෂරතාවයත් අතර "දැඩි සම්බන්ධතාවක් පවතින" බවත්, 26%ක් දෙනා පෙර දැක්වූ විචල්‍යයන් දෙක අතර "සම්බන්ධතාවක් පවතින" බවත් සඳහන් කර ඇත. නියැදියේ 31%ක පිරිසක් අපරාධ පාලනය හා නිවාරණය සහ නෛතික සාක්ෂරතාව අතර "තරමක සම්බන්ධතාවක් ඇති බවත්" දක්වා ඇති අතර එක් දත්ත දායකයකු පමණක් (1%) එම සංකල්ප දෙක අතර සබඳතාවක් නොපවතින බව සඳහන් කර ඇත. නෛතික සාක්ෂරතාව වනාහී අපරාධ පාලනය හා නිවාරණය උදෙසා වැදගත් වන බවට වු දත්ත දායක මතය පහත පරිදි දැක්විය හැකිය.

> *"මෙරට අපරාධවලට ඇති දඬුවම් පිළිබඳව නිසි අවබෝධයක් පැවතීම අපරාධ පාලනයට හේතුවක් වන්නේය" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 08, 2020).*

> *"දිනෙන් දින ඉහළ යන අපරාධ වැළැක්වීම නීතිය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීමෙන් සිදුකළ හැකිය" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 03, 2020).*

රටක අපරාධ පාලනය හා නිවාරණය විධිමත් හා ක්‍රමවත් අයුරින් සිදුකර ගැනීම සඳහා නෛතික සාක්ෂරතාවක් ඇති ප්‍රජාවක් සිටිය යුතු බවට වන ස්ථාවරයේ 74% ක දත්ත දායක පිරිසකගේ මතය බව නිරීක්ෂණය විය. ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව ඉහළ වූ පමණින් අපරාධ පාලන හා නිවාරණ ක්‍රියාවලිය විධිමත් නොවන බවට සමස්ත අදහස පළ කළ දත්ත දායක ප්‍රතිශතය වන්නේ 25% කි. ඒ අනුව බහුතර මතය වන්නේ අපරාධ පාලන හා නිවාරණ ක්‍රියාවලිය විධිමත් හා ක්‍රමවත් වීමට ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතිය යුතු බවයි.

අපරාධ යුක්ති ආයතන කාර්යක්ෂම වීම සඳහා ප්‍රජාව සතු නෛතික සාක්ෂරතාවයේ වැදගත්කම පිළිබඳව විමසීමේ දී දත්ත දායකයන් 60 දෙනා අතුරින් 81%ක් සඳහන් කර ඇත්තේ ප්‍රජාව සතුව මනා වූ නෛතික සාක්ෂරතාවක් පැවතීම අපරාධ යුක්ති ආයතනවල කාර්යක්ෂමතාව උදෙසා අනිවාර්යෙන් ම වැදගත් වන බවයි. ඒ සම්බන්ධයෙන් "වැදගත් වේ" යන පිළිතුර ලබාදුන් දත්ත දායකයන් 8%ක් වන අතර දත්ත දායකයන් 10%ක් "තරමක් වැදගත් වේ" යන පිළිතුර දක්වා ඇත. මෙහි දී අපරාධ යුක්ති ආයතන කාර්යක්ෂම වීම සඳහා ප්‍රජාව සතු නෛතික සාක්ෂරතාව"වැදගත් නොවේ" හෝ "කිසිසේත් ම වැදගත් නොවන" බවට ප්‍රතිචාර දැක් වූ කිසිවකු ද නොවේ. ඒ අනුව දත්ත දායකයන් 100% කගේ ම මතය මඟින් පැහැදිලි වන්නේ ප්‍රජාව වෙත නෛතික සාක්ෂරතාව පැවැතීම අපරාධ යුක්ති ආයතනවල කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයට වැදගත් වන බවයි.

ශ්‍රී ලංකාවේ ජනතාව මෙරට අපරාධ පාලන හා නිවාරණ ක්‍රියාවලිය උදෙසා දක්වන දායකත්වයේ ප්‍රමාණය පිළිබඳව සහ රටක අපරාධ පාලනය හා නිවාරණය සඳහා සියලු ම ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව අවශ්‍ය වන්නේ ද යන ප්‍රශ්න ද්විත්වය උදෙසා මෙම පර්යේෂණයට භාජනය වූ දත්ත දායකයන් විසින් දැක්වූ ප්‍රතිචාරයන් හි සංසන්දනාත්මක විශ්ලේෂණය පහත ලෙස දැක්විය හැකිය.මෙරට ජනතාව අපරාධ පාලන හා නිවාරණ ක්‍රියාවලියට ප්‍රමාණවත් දායකත්වයක් දක්වන බවට වන පිළිතුරු ලබා දුන් සමස්ත දත්ත දායකයන් සංඛ්‍යාව 17 කි. එය ප්‍රතිශතයක් ලෙස 28% කි. ඒ අනුව 43 (71%) ක් තරම් වූ බහුතර දත්ත දායක පිරිසක් සඳහන් කරනුයේ මෙරට ජනතාවගේ දායකත්වය ප්‍රමාණවත් නොවන බවයි. එම නිසාවෙන් ම 88% ක් වූ දත්ත දායක මතය වන්නේ ද අපරාධ පාලනය හා නිවාරණය සඳහා සියලු ම ප්‍රජාව වෙතට නෛතික සාක්ෂරතාව පැවතිය යුතු බවයි.

**වගු අංක 1.** අපරාධ පාලනය හා නිවාරණය පිණිස ශ්‍රී ලාංකේය ජනතාවගේ දායකත්වය සහ සියලු ම ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාවයේ අවශ්‍යතාව (ක්ෂේත්‍ර පර්යේෂණය, 2020).

| විචල්‍ය හා සාධක | | | රටක අපරාධ පාලනය හා නිවාරණයට සියලු ම ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව අවශ්‍ය බව | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | අනිවාර්යයෙන් ම අවශ්‍ය වේ | අවශ්‍ය වේ | තරමක් අවශ්‍ය වේ | අවශ්‍ය නොවේ | කිසිසේත් ම අවශ්‍ය නොවේ | එකතුව |
| ශ්‍රී ලංකාවේ අපරාධ පාලනය හා නිවාරණය ට මෙරට ජනතාවගේ දායකත්වය | අතිශයින් ම ප්‍රමාණවත් වේ | සංඛ්‍යාව | 1 | 0 | 0 | 1 | 0 | 2 |
| | | ප්‍රතිශතය | 50% | 0% | 0% | 50% | 0% | 100 % |
| | ප්‍රමාණවත් වේ | සංඛ්‍යාව | 9 | 2 | 0 | 1 | 0 | 12 |
| | | ප්‍රතිශතය | 75% | 16% | 0% | 8% | 0% | 100 % |
| | තරමක් ප්‍රමාණවත් වේ | සංඛ්‍යාව | 2 | 0 | 0 | 1 | 0 | 3 |
| | | ප්‍රතිශතය | 66% | 0% | 0% | 33% | 0% | 100 % |
| | ප්‍රමාණවත් නොවේ | සංඛ්‍යාව | 11 | 8 | 11 | 2 | 0 | 32 |
| | | ප්‍රතිශතය | 34% | 25% | 34% | 6% | 0% | 100 % |
| | කිසිසේත් ම ප්‍රමාණවත් නොවේ | සංඛ්‍යාව | 5 | 2 | 2 | 1 | 1 | 11 |
| | | ප්‍රතිශතය | 45% | 18% | 18% | 9% | 9% | 100 % |
| එකතුව | | සංඛ්‍යාව | 28 | 12 | 13 | 6 | 1 | 60 |
| | | ප්‍රතිශතය | 46% | 20% | 21% | 10% | 1% | 100 % |

එමෙන් ම ඉහත වගු අංක 1 පරීක්ෂාකර බැලීමේ දී රටක අපරාධ පාලනය හා නිවාරණය උදෙසා සියලු ම ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව අවශ්‍ය නොවන බවට වන පිළිතුරු දක්වමින් විසංවාදී මතයක් දරා ඇත්තේ සමස්ත දත්ත දායකයන් අතුරින් 11% ක් තරම් සුළු පිරිසකි.

මේ පිළිබඳව තව දුරටත් විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ දත්ත දායකයන් 60 දෙනා අතුරින් 32 කගේ මතය වී ඇත්තේ මෙරට ජනතාව අපරාධ ක්‍රියා පාලනය හා නිවාරණය සඳහා ප්‍රමාණවත් දායකත්වයක් නොදක්වන බවයි. එම නියැදියේ 32 න් 93% ක ප්‍රතිශතයක් රටක අපරාධ පාලනය හා නිවාරණයට සියලු ම ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව පැවැතිය යුතු බවට පක්ෂව මතයක් දරන බව නිරීක්ෂණය කළ හැකි විය. එමෙන් ම මෙරට පොදු ජනතාව අපරාධ පාලනය හා නිවාරණය දක්වන දායකත්වය කිසිසේත් ම ප්‍රමාණවත් නොවන බවට දත්ත දායකයන් 11 දෙනෙකු සඳහන් කර ඇත. එම පිරිසෙන් 81% ක ප්‍රතිශතයක් ද අපරාධ පාලනය හා නිවාරණය පිණිස සියලු ම ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව අවශ්‍ය වන බවට පක්ෂ වූ මතය දරයි.

එබැවින් අවසන් වශයෙන් සඳහන් කළහැකි වන්නේ ශ්‍රී ලාංකික ජනතාව අපරාධ පාලනය හා නිවාරණයට ප්‍රමාණවත් දායකත්වයක් නොදක්වන බවත් අපරාධ පාලනය හා නිවාරණයට රටක සියලු ම ප්‍රජාව වෙතට නෛතික සාක්ෂරතාව අවශ්‍ය වන බවත් ය.

### 3.3 නෛතික සාක්ෂරතාව ලබාදීමේ වාසි හා අවාසි

රටක සමස්ත ප්‍රජාව සඳහා නෛතික සාක්ෂරතාවය ලබාදීම පොදු සමාජයේ යහපැවැත්ම සඳහා වාසිදායක වන බවත් ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව ඇති කිරීම තුළ නීති ගරුක ප්‍රජාවක් බිහි වන බවත් දත්ත දායකයෝ විශ්වාස කරති.

පහත වගු අංක 2 විමසීමේ දී පෙනී යන්නේ රටක සමස්ත ප්‍රජාවට නෛතික සාක්ෂරතාව ලබාදීම පොදු සමාජයේ යහපැවැත්ම උදෙසා වාසිදායක නොවන බවට ප්‍රතිචාර දැක් වූ කිසිදු දත්ත දායකයෙකු නොමැති බවයි. දත්ත දායකයන් 100%කගේ ම මතය වී ඇත්තේ ප්‍රජාව නෛතික සාක්ෂරතාවයෙන් බලගැන්වීම වාසිදායක වන බවට පක්ෂව මතයන් ය.

**වගු අංක 2.** සමස්ත ප්‍රජාව වෙතට නෛතික සාක්ෂරතාව ලබාදීම, පොදු සමාජයේ යහපතට හා නීති ගරුක ප්‍රජාවක් බිහිවීමට දායක වන අයුරු (ක්ෂේත්‍ර පර්යේෂණය, 2020).

| **විචල්‍ය හා සාධක** | | | **ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව ඇති කිරීම තුළ නීතිගරුක ප්‍රජාවක් බිහිවන බව** | | | | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| | | | **දැඩිව විශ්වාස කරමි** | **විශ්වාස කරමි** | **තරමක් විශ්වාස කරමි** | **විශ්වාස නොකරමි** | |
| රටක සමස්ත ප්‍රජාව සඳහා නෛතික සාක්ෂරතාව ලබාදීම පොදු සමාජයේ යහපැවැත්ම සඳහා වාසිදායක බව | අතිශයින් ම වාසිදායක වේ | සංඛ්‍යාව | 12 | 19 | 4 | 4 | 39 |
| | | ප්‍රතිශතය | 30% | 48% | 10% | 10% | 100% |
| | වාසිදායක වේ | සංඛ්‍යාව | 0 | 9 | 1 | 0 | 10 |
| | | ප්‍රතිශතය | 0% | 90% | 10% | 0% | 100% |
| | තරමක් වාසිදායක වේ | සංඛ්‍යාව | 0 | 5 | 3 | 3 | 11 |
| | | ප්‍රතිශතය | 0% | 45% | 27% | 27% | 100% |
| එකතුව | | සංඛ්‍යාව | 12 | 33 | 8 | 7 | 60 |
| | | ප්‍රතිශතය | 20% | 55% | 13% | 11% | 100% |

එමෙන් ම ප්‍රජාවගේ නෛතික සාක්ෂරතාව ඇති කිරීම තුළ, නීති ගරුක ප්‍රජාවක් බිහි වන බවට පක්ෂව වූ බහුතර මතය දරන දත්ත දායකයන් ප්‍රතිශතය 88% කි. ඉන් 11% ක පිරිසක් එම ප්‍රකාශය විශ්වාස නොකරන බවත් අනාවරණය විය.

ඒ අනුව පැහැදිලි වන සමස්ත අදහස වන්නේ රටක සමස්ත ප්‍රජාව වෙත ම නෛතික සාක්ෂරතාව ලබාදීම පොදු සමාජයේ යහපැවැත්ම සඳහා වාසිදායක තත්ත්වයන් ඇති කරන බවත්, ඒ තුළින් නීති ගරුක ප්‍රජාවක් බිහිවීම සඳහා මග පෑදෙන බවත්ය.


නීතිය නොදැන සිටීමෙන් නිදහස්වීම පිණිස නෛතික සාක්ෂරතාව ඇති කිරීම යෝග්‍ය වන බව 75%ක දත්තදායක මතය වී ඇත. මෙහි දී දත්ත දායකයින් 24%ක පිරිසක් එකි ප්‍රායෝගික තත්ත්වය කරා ළඟාවිය නොහැකි බව දැක්වුව ද බහුතර මතය වන්නේ "නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ" යන නීතිමය තර්කයෙන් මිදීම පිණිස නෛතික සාක්ෂරතාව ඇති කිරීම යෝග්‍ය වන බවයි.

ළමා වියේ දී සංවර්ධනය විය යුතු තර්කන හැකියාව, විවේචනාත්මක චින්තනය, යහපත් සන්නිවේදන කුසලතා සංවර්ධනය, ගැටලු විසඳීමේ හැකියාව වර්ධනය වීම ආදී ළමා පෞරුෂමය ලක්ෂණයන්, ළමා වියේ සිට ම නෛතික සාක්ෂරතාව ලබා දීමෙන් සංවර්ධනය කරගත හැකි බවට වන මතය සහ මෙරට අධ්‍යාපන ප්‍රතිපත්තීන් හරහා කනිෂ්ඨ ද්විතීයික පාසල් ශිෂ්‍ය අවදියේ දී සාධනය කර ගැනීමට බලාපොරොත්තු වන "ගැටුම් වලින් නිදහස් සමාජයක ජීවත් වීමේ වැදගත්කම" පිළිබඳ කරුණ සාක්ෂාත් කර ගැනීමට නෛතික සාක්ෂරතාව ලබාදීමේ වැදගත්කම පිළිබඳව දත්ත දායකයන් දැක් වූ මතයන් පිළිබඳව විශ්ලේෂණාත්මක අදහසක් රූපසටහන 1 තුළින් දක්වා ඇත.

දත්ත දායකයන් 60 දෙනා අතුරින් 57 ක් (95%) සඳහන් කරනුයේ ළමා පෞරුෂමය ලක්ෂණ සංවර්ධනයට නෛතික සාක්ෂරතාව කුමන හෝ මට්ටමකින් දායකත්වයක් දක්වන බවයි.

නෛතික සාක්ෂරතාව ලබාදීම ළමා පෞරුෂමය ලක්ෂණ සංවර්ධනය දායකත්වයක් නොලැබෙන බවට දත්ත දායකයන් තිදෙනෙකු (5%) අදහස් කරන අතර, කිසිම දත්ත දායකයෙකු කිසිසේත් ම දායකත්වයක් නොලැබේ යන පිළිතුර තෝරා නැත.

ඒ අනුව 95%ක මතය වන්නේ ළමා වියේ පෞරුෂමය ලක්ෂණ සංවර්ධනයට නෛතික සාක්ෂරතාව බලපාන ලබන බවයි.




**රූපසටහන 1.** ළමා වියේ පෞරුෂය සංවර්ධනයට සහ ගැටුම් වලින් මිදී ජීවත් වීමට හුරුවීම සඳහා නෛතික සාක්ෂරතාවයේ දායකත්වය

ඉගෙනුම් ක්‍රියාවලියේ අරමුණ වන්නේ මානවයාගේ චර්යාව යහපත් යැයි සම්මත ආකාරයෙන් ගොඩනැංවීමයි. ඒ හා සම්බන්ධව දත්ත දායකයන් දැක්වූ අදහස් කිහිපයක් පහත අයුරින් දැක්විය හැකිය.

> *"පුද්ගල චර්යා වෙනස් කිරීමේ දී වර්තමානය වන විට පාසල් අධ්‍යාපනය විශාල කාර්යභාරයක් ඉටුකරයි. ඒ අනුව නීති අධ්‍යාපනය ද යහපත් මානව චර්යා නිර්මාණය කරන බැවින් නීති අධ්‍යාපනය පාසල් විෂය නිර්දේශයට එකතු විය යුතුය" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 19, 2020).*

> *"පුද්ගල චින්තනය වෙනස් කරමින් ප්‍රචණ්ඩකාරීත්වය අවම කිරීම උදෙසා නීති අධ්‍යාපනය වැදගත් වේ" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 23, 2020).*

> *"රටක ජීවනාලිය වන දරු පරපුරෙහි කැඩපත වන්නේ ඔවුන් ලබන අධ්‍යාපනය හා ගුරුවරයා යි. මෙම කැඩපත මගින් නීති අධ්‍යාපනය ලැබේ නම් තර්කානුකූලව සිතා ගැටලු වලට නිවැරදි අයුරින් මුහුණ දෙන ප්‍රජාවක් අනාගතයේ බිහිවෙයි" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 27, 2020).*

ළමයාගේ පාසල් අවධිය යනු ළමා චර්යාවන් යහපත් අයුරින් ගොඩනගන්නා වූ කාල පරාසයකි. ඒ අනුව පර්යේෂණයට භාජනය වූ දත්ත දායකයන් 60 දෙනා අතරින් 59 ක (98%) පිරිසකගේ මතය වන්නේ ගැටුම් වලින් මිදී නිදහස් සමාජයක ජීවත් වීමේ ගුණය ප්‍රගුණ කිරීම උදෙසා නෛතික සාක්ෂරතාව ලබා දීම මගින් මහගු දායකත්වයක් දක්වන බවයි. එක් දත්ත දායකයෙකු (1%) පමණක් "දායකත්වයක් නොදක්වයි" යන මතය දරන අතර කිසිවකු " කිසිසේත් ම දායකත්වයක් නොදක්වයි" යන පිළිතුර තෝරා නොමැත. ඒ අනුව බහුතර මතය වන්නේ මෙරට අධ්‍යාපන ප්‍රතිපත්තීන් ඔස්සේ කනිෂ්ඨ ද්විතීයික පාසල් අවධියේ දී සාධනය කර ගැනීමට බලාපොරොත්තු වන ගැටුම් වලින් නිදහස් සමාජයක ජීවත් වීමේ වැදගත්කම පිළිබඳව වන්නා වූ ලක්ෂණය සාක්ෂාත් කර ගැනීමට නෛතික සාක්ෂරතාව ලබාදීම වැදගත් වන බවයි.

ගැටුම් වලින් තොර වූ යහපත්, සාමකාමී හා වගකීම් සහගතව කටයුතු කරන ප්‍රජාවක් නිර්මාණය කිරීම උදෙසා නීති අධ්‍යාපනයේ යෝග්‍යතාව පිළිබඳව අවධානය යොමුකරමින් දත්ත දායකයින් විසින් දැක්වූ අදහස් පහත පරිදි වේ.

> *"නෛතික සාක්ෂරතාව ඉහළ නැංවීමට පාසල් අවධිය යනු හොඳම අවස්ථාවකි" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 04, 2020).*

> *"ළමයින් අපරාධ සඳහා යොමුවීම වැළැක්වීමට නීති අධ්‍යාපනය වැදගත් වේ" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 31, 2020).*

> *"පාසලෙන් පසු සමාජ ගතවීමේදී යහපත් සාමකාමී සමාජයක් නිර්මාණය කිරීමට පාසල් අවධියේ දී නීති අධ්‍යාපනය ලැබීම වැදගත් වේ" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 46, 2020).*

> *"නීතිගරුක ප්‍රජාවක් බිහිවීම පිණිස පාසල් කාලයේ සිට ම නීතියේ දැනුම අවශ්‍ය වේ" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 24, 2020).*

> *"වර්තමානයේ ඇති සංස්කෘතික, දේශපාලනික හා අධ්‍යාපනික ගැටලු බොහෝමයක් විසඳීම පිණිස නීති අධ්‍යාපනය වැදගත් වේ" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 12, 2020).*

> *"පුරවැසි වගකීම් පෙන්වා දෙමින් වගකීම් සහගත ප්‍රජාවක් නිර්මාණය උදෙසා නීති*

*අධ්‍යාපනය වැදගත් වේ" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 02, 2020).*

## 3.4 පුද්ගලයා සංවර්ධනය සඳහා නෛතික සාක්ෂරතාවයේ අවශ්‍යතාව

මෙම පර්යේෂණයේ දත්ත දායකයින් අතුරින් 36%ක පිරිසක් ඔවුන් සතු නෛතික සාක්ෂරතාවය පිළිබඳව තෘප්තිමත් වුව ද 63%ක පිරිසක් තුළ තෘප්තිමත් භාවයක් නොපවතියි. එබැවින් 95%ක දත්ත දායක පිරිසක් අපරාධ නීතිය ඉගෙනීමේ අවශ්‍යතාවයෙන් පෙළෙන අතර 5%ක පිරිසක් හට එවැනි අවැසිතාවක් නොමැති බව සඳහන් කර ඇත.

පර්යේෂණයට සහභාගි වූවන්ගෙන් 75%ක පිරිසක් විසින් පුද්ගලයා අපරාධ සිදුකිරීමට යොමුවීමටත් අපරාධයක වින්දිතයෙකු බවට පත්වීමටත් නෛතික සාක්ෂරතාව නොලැබ සිටීම හේතුවක් වන බව දක්වන අතර, නියැදියේ 24%ක පිරිසක් පුද්ගල අපරාධකාරීත්වය පිණිස සහ වින්දිතකරණය පිණිස නෛතික සාක්ෂරතාව නොලැබ සිටීම හේතුවක් නොවන බව දක්වා ඇත.

අපරාධයක ගොදුරක් නොවීමටත්, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය තුළ කිසිදු සැකයකින් තොරව සාධාරණය ඉටුකර ගැනීමටත් නෛතික සාක්ෂරතාවයේ වැදගත්කම පිළිබඳ දත්ත දායකයන් දැක්වූ අදහස් පහත දක්වා ඇත.

> *"අපරාධවලට ගොදුරු වීමට ඇති අවදානම් සාධක හඳුනා ගැනීමට හැකිය" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 52, 2020).*

> *"නීතිය ඉදිරියේ අසාධාරණයට ලක්වීම වර්තමානයේ ඇති ප්‍රායෝගික තත්ත්වයක් වන බැවින් නීතිය දැන සිටීම නිසාවෙන් අවනීතියේ ගොදුරක් වීම වළක්වයි" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 49, 2020).*

> *"වර්තමානයේ මහා පරිමාණ අපරාධ සිදු කරන්නේ බොහොමයක් උගත් ප්‍රජාව බැවින් ඔවුන් එසේ සිදුකරන්නේ බහුතර ජනතාව නීතිය නොදන්නා බැවිනි. එම නිසා සමහර බලවතුන් හෝ උගතුන් කරන අපරාධ වලට එරෙහිව ජනමතයක් ඇති කිරීමට සියලු ප්‍රජාව වෙතට අපරාධ නීතිය පිළිබඳ දැනුම ලබාදීම පාසල් වියේ දී සිදුවිය යුතුය" (ක්ෂේත්‍ර පර්යේෂණය. ප්‍රශ්නාවලිය අංක 32, 2020).*

මෙරට ජනතාව තුළ ප්‍රමාණවත් නෛතික සාක්ෂරතාවක් ඇති බවට වන පිළිතුරු ලබා දුන් සමස්ත පිරිස ප්‍රතිශතයක් ලෙසට 40%ක් වුවත් මෙම පර්යේෂණයේ 59%ක් වූ බහුතර පර්යේෂිත විශ්වාසය වන්නේ ප්‍රමාණවත් නෛතික සාක්ෂරතාවක් මෙරට පුරවැසියන් තුළ නොමැති බවයි. එම නිසාවෙන් 100%ක් වූ සියලු ම දත්ත දායකයින් දක්වනුයේ අපරාධ නීතියේ දැනුම අනිවාර්යෙන් ම මෙරට ජනතාවට ලබාදිය යුතු බවයි.

## 3.5 නෛතික සාක්ෂරතාව ලබාදිය යුතු ක්ෂේත්‍ර

නීතිය යනු රටක සියලු ම ප්‍රජා වෙතට අනිවාර්යෙන් ම අවශ්‍ය අංගයක් වුවත් වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ විධිමත් හා ක්‍රමවත් ආකාරයට නීතිය පිළිබඳ අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ඇත්තේ ඉතාමත් ම සීමිත පිරිසකට පමණි. ඒ තුළ නීති පීඨ සිසුන් හා නීති විද්‍යාල සිසුන් සුවිශේෂී වන්නේය. එබැවින් මෙරට තුළ සීමිත හා සුවිශේෂී පිරිසකට පමණක් නීති අධ්‍යාපනය ලැබීමට කටයුතු සැලසීම කෙතරම් දුරට යෝග්‍ය වන්නේ ද යන්න පිළිබඳව විමසීමේ දී දත්ත දායක පිරිසෙන් 18%ක පිරිසක් මෙරට තුළ තවමත් සීමිත හා තෝරාගත් පිරිසකට පමණක් නීතිය පිළිබඳ අධ්‍යාපනය ක්‍රමවත්ව හා විධිමත්ව ලබා දීමට පක්ෂව වූ මතය ප්‍රකාශ කළ අතර 81%ක් වූ බහුතර මතය වී ඇත්තේ එලෙස සීමිත හා සුවිශේෂී පිරිසකට පමණක් නෛතික දැනුම ලබාදීම තවදුරටත් නොවිය යුතු බවයි. ඒ අනුව පැහැදිලි වන්නේ රටේ සමස්ත ප්‍රජාව වෙත නෛතික දැනුම ලැබීමට කාලය එළඹ ඇති බවයි.
මෙරට ජනතාව අතුරින් නෛතික සාක්ෂරතාව අධ්‍යාපනික වශයෙන් ලබාදීමට ප්‍රමුඛතාවය ලැබිය යුතු ක්ෂේත්‍ර කිහිපයක් (පාසල් සිසුන්, රාජ්‍ය අංශයේ සේවකයින්, පෞද්ගලික අංශයේ සේවකයින්, ස්වයං රැකියාවන්හි නියුතු, රැකියා විරහිත පිරිස්, කම්කරු පිරිස් හා වෙනත්) පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පාසල් සිසු සිසුවියන්ට ලැබිය යුතු ප්‍රමුඛතාව පිළිබඳව දත්ත දායකයන් දැක්වූ මතය පහත රූපසටහන 2 මගින් දක්වා ඇත.


ඒ අනුව පැහැදිලි වන්නේ මෙරට විවිධ වූ ක්ෂේත්‍ර තුළින් පාසල් දරුවන් වෙතට නීතියේ දැනුම ලබාදීමට කටයුතු සිදුකිරීමේ දී දත්ත දායකයන් අතුරින් 70% ක පිරිසක් පාසල් දරුවන්ට පළමු ස්ථානය ලබා දී ඇති බවයි. එබැවින් මෙම දත්ත දායකයන් වන පාසල් ගුරුවරුන්ගේ මතය වන්නේ නීතියේ දැනුම සියලු ම ප්‍රජාව වෙත ලබා දීමට කටයුතු සිදුකිරීමේ දී සුදුසුම හා ප්‍රමුඛතාව දිය යුතු ක්ෂේත්‍රය වන්නේ පාසල් ළමා පරපුර වන බවයි.

පාසල් ළමයින් සමඟ නිරන්තර ව කටයුතු කරනු ලබන ගුරු ප්‍රජාව තුළින් විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ සමස්තයක් ලෙස ගත් විට බොහෝ පාසල් ළමයින් විවිධ අපරාධ හා අපචාර ක්‍රියාවලට කුමන හෝ මට්ටමකින් යොමු වීමට ඉඩ ඇති බවයි. එය ප්‍රතිශතයක් ලෙසට 100% කි. ඒ අනුව මෙහිදී කිසිදු දත්ත දායකයෙකු ළමයින් අපරාධ හා අපචාර වලට යොමු වීමට ඉඩ නැති බවට හෝ කිසිසේත් ම යොමු නොවන බවට ප්‍රතිචාරයක් දක්වා නොමැත. එබැවින් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අපරාධ නීතියේ දැනුම ලබා දීමේ අවශ්‍යතාව විමසීමේ දී සමස්තයක් ලෙසට එහි සුදුසු භාවයට පක්ෂව පවතින මතයන් දරන පිරිසේ ප්‍රතිශතය 98% කි. එනම් බහුතර මතය එයයි. පාසල්


ළමයින්ට අපරාධ නීතියේ නෛතික සාක්ෂරතාව ලබාදීමට විපක්ෂ වන මත දරන්නන් 1% ක් තරම් වූ සුළු පිරිසකි. ඒ අනුව අවසන් වශයෙන් පැහැදිලි කළහැකි වන්නේ පාසල් ක්ෂේත්‍රයේ නියුතු ගුරුවරුන්ට අනුව ළමයින් බහුතරයක් විවිධ අවස්ථාවන්වල දී අපරාධ හෝ අපචාර සඳහා යොමු වීමට ඉඩ ඇති බවත් එබැවින් ළමා පරපුර වෙත පාසල් අවධියේ දී අපරාධ නීතිය පිළිබඳ දැනුම හා අවබෝධය ලබාදීම වීම සුදුසු වන බවත් ය.

අපරාධ නීතිය පිළිබඳ දැනුම ලබාදීම සඳහා පාසල් අවධිය සුදුසු බව ඉහත දත්ත විශ්ලේෂණය තුළින් පැහැදිලි වේ. ඒ අනුව මෙම ඉගැන්වීම් කටයුත්ත සඳහා පාසල් අවධියේ කනිෂ්ඨ ද්විතීයික පාසල් අවධිය යොදාගැනීම ප්‍රායෝගික වන බවට 40% ක දත්ත දායක පිරිසක් දක්වා ඇත. එසේ ම එය " ප්‍රායෝගික වේ" යන මතය දරන 25% ක පිරිසක් ද, "තරමක් ප්‍රායෝගික වේ" යන මතය දරන 35% ක පිරිසක් ද වේ.

එබැවින් 100% ක් වූ දත්ත දායක පිරිසේ මතය වන්නේ අපරාධ නීතියේ දැනුම පාසල් අධ්‍යාපනයට එකතු කිරීමේ දී කනිෂ්ඨ ද්විතීයික ශිෂ්‍ය අවධිය සුදුසු වන බවයි.




**රූපසටහන 2.** නෛතික සාක්ෂරතාව ලබා දීමේ දී පාසල් සිසු සිසුවියන් හට ලබාදුන් ප්‍රමුඛතා පිළිවෙළ




**රූපසටහන 3.** අපරාධ නීතියේ දැනුම ලබාදිය යුතු ආකාර

### 3.6 පුද්ගලයා වෙත නෛතික සාක්ෂරතාවයේ ලබාදිය යුතු ආකාරය

ලොව අනෙකුත් රටවල් තුළ (මැලේසියාව, ලිතුවේනියාව, ඇමරිකාව වැනි) නීති අධ්‍යාපනය පාසල් ඇසුරින් පුද්ගලයාට ලබාදෙමින් සමාජගත කිරීමට උත්සාහ දරන බව දන්නා දත්ත දායක පිරිස 55%ක් වන අතර ඒ පිළිබඳව අනවබෝධයෙන් පසුවන පිරිස 45%කි.

මෙරට ජනතාවට අපරාධ නීතියේ දැනුම පාසල් අධ්‍යාපනය මගින් ලබා දීමේ දී ක්‍රියාත්මක විය යුතු විවිධ ආකාරයන් පිළිබඳ දත්ත දායක මතය රූපසටහන 3 පරිදි වේ.

අපරාධ නීතිය තනි විෂයයක් ලෙස විෂය නිර්දේශයට එකතු කිරීමට පක්ෂ අදහස් දරන සමස්ත දත්ත දායක පිරිස 44 (73%) කි. ඒ සම්බන්ධව විපක්ෂ මතය දරන්නන් ගණන 16 (26%) කි. මෙම විෂය ප්‍රධාන විෂයක් ලෙසට ඉගැන්විය යුතුය යන මතය දරන සමස්ත දත්තදායක සංඛ්‍යාව වන්නේ 45 (75%) කි. ඒ සබැඳිව විපක්ෂව මතය දරන්නන් පිරිස 15 (25%) කි.

අපරාධ නීතිය පාසල් අධ්‍යාපනයට එකතු කිරීමේ දී ඒ සඳහා ගුරුවරුන්ගේ අනුකූලතාව විමසා බැලීම වැදගත් වේ. එබැවින් අපරාධ නීතිය විෂය ඉගැන්වීම පිණිස දැනට සේවයේ නියුතු ගුරුවරුන් පුහුණු කිරීම පිළිබඳව එකගතාව දක්වන සමස්තය වන්නේ 52 (86%) කි. එයට එකගතාව නොදක්වන පිරිස 08 (13%) කි. කෙසේ නමුත් මෙම විෂය වඩාත් ගුණාත්මක අයුරින් ඉගැන්වීම සඳහා ක්ෂේත්‍රයේ ඉහළ සුදුසුකම් සහිත උපාධිධාරීන්, වෘත්තිකයන් ගුරු සේවයට බඳවාගැනීම සුදුසු යැයි අනුමත කරන පිරිස 57 (95%) කි. එය අනුමත නොකරන සමස්තය වන්නේ 03 (5%) ක් පමණි.

ඕනෑම විෂයක් අධ්‍යයනයේ දී න්‍යායික කරුණු පමණක් ශිෂ්‍යා හට ලබාදීමේ දී එම විෂය සිසු ප්‍රජාවට නීරස විය හැකිය. එබැවින් විෂය කරුණු ඉගැන්වීමේ දී ප්‍රායෝගික ක්‍රමවේද භාවිතය අනුමත කරන සමස්ත පිරිස 59 (98%) කි. එමෙන් ම විෂය කරුණු රසවත්ව සහ සිද්ධි අධ්‍යයනයන් සමග ගුණාත්මක අයුරින් ශිෂ්‍ය ප්‍රජාව වෙත ලබාදීම සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණ විශේෂඥයින් වන නීතීඥයින්, පොලිස් නිලධාරීන්, අපරාධ විමර්ශකයින් වැනි අයගේ සම්පත් දායකත්වය ලබාගැනීම සුදුසු යැයි අනුමත කරන සමස්ත පිරිස 58 (96%) කි.

අවසන් වශයෙන් ලෝකය සමග යාවත්කාලීන වෙමින් ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ප්‍රතිපත්තිය යාවත්කාලීන කරමින් පාසල් විෂය නිර්දේශයට නීතිය අධ්‍යාපනය එකතු කිරීම කාලීන අවශ්‍යතාවක් වන්නේ ද යන්න සඳහා 95% ක බහුතර පිරිසක් සඳහන් කරනුයේ මෙරට වත්මන් අධ්‍යාපන ප්‍රතිපත්ති යාවත්කාලීන වෙමින් නීති අධ්‍යාපනය පාසල් අධ්‍යාපනයට එක්විය යුතු බවයි. මෙරට පවතින අධ්‍යාපන ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් විය යුතු බවත් මෙරට බොහෝ ගැටලුවලට විසඳුම අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් වීම බවත් බහුතර දත්ත දායකයන්ගේ අදහස වේ. ඒ අනුව පාසල් කාලයේ සිට ම නීතිය පිළිබඳ දැනුම ලැබීම වැදගත් වන බවත් ඒ සඳහා නිසි අයුරින්, වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති යාවත්කාලීන විය යුතු බව බහුතර දත්ත දායක මතය වී ඇත.

## 4. නිගමන සහ නිර්දේශ

අපරාධ පාලනය හා නිවාරණයෙහිලා නෛතික සාක්ෂරතාව බලපාන බැවින් ඉහළ නෛතික සාක්ෂරතාවකින් යුක්ත ප්‍රජාවක් ජීවත් වන සමාජයක අපරාධ පාලනය හා නිවාරණය මැනවින් සපුරා ගැනීමට හැකියාව ඇති බව මෙහි දී නිගමනය විය. අපරාධ යුක්ති ආයතන වලින් විධිමත් හා ක්‍රමවත් වූ කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම උදෙසා සමාජිකයන් හට නෛතික සාක්ෂරතාව පැවතීම ඉතාමත් ම වැදගත් වුවද ශ්‍රී ලාංකිකයන් මෙරට අපරාධ පාලනය හා නිවාරණ ක්‍රියාවලියට ක්‍රියාශීලී දායකත්වයක් නොදක්වන බව ද මෙහි දී ප්‍රත්‍යක්ෂ විය.

සමාජිකයන්ගේ යහපැවැත්මටත් නීතිගරුක ප්‍රජාවක් බිහි කිරීමටත් සමස්ත ප්‍රජාව නෛතික සාක්ෂරතාවයෙන් බලගන්වා නීතිය නොදැන සිටීමෙන් ජනයා මුදවාලිය හැකි බව මෙහිදී නිගමනය විය. Evil Wilma Joninia iy Lina Petrauskienė (2013) විසින් සිදුකළ පර්යේෂණයට තව දුරටත් දිගුවක් වෙමින් මෙම පර්යේෂණයෙන් ළමා වියේ දී සංවර්ධනය කරගැනීමට බලාපොරොත්තු වන ළමා පෞරුෂමය ලක්ෂණ වර්ධනය කර ගැටුම් වලින් මිදී නිදහස් සාමකාමී සමාජයක ජීවත් වීමේ අවශ්‍යතාව ඇති ප්‍රජාවක් බිහි කිරීමට නෛතික සාක්ෂරතාව වැදගත් වන බව ද මෙහි දී පැහැදිලි විය.

දත්ත දායකයන් බහුතරයකට ප්‍රමාණවත් නෛතික සාක්ෂරතාවක් නොවූ හෙයින් ඔවුන්හට ඒ පිළිබඳව ඉගෙනීමේ අවශ්‍යතාවක් ද ඇත්තේය. Kim Economides (2015) විසින් තහවුරු කළ පරිදිම මෙම පර්යේෂණයෙන් ද තහවුරු වන්නේ පුද්ගලයා තුළ මනා වූ නෛතික සාක්ෂරතාවක් නො පැවතීම නිසා අපරාධ ක්‍රියාවලට යොමු වීමට හැකියාවක් ඇති බවත් අපරාධයක වින්දිතයකු වීම හෝ තම අයිතිවාසිකම් දිනා ගැනීමට යොමු නො වීමටත් හේතුවක් වන බවයි. එබැවින් ලාංකේය ප්‍රජාව හට අපරාධ නීතියේ දැනුම ලබාදිය යුතු බව නිගමනය වේ. Amit K. Kashyap (2016) විසින් සිදුකළ පර්යේෂණයට දිගුවක් ගෙනදෙන මෙම පර්යේෂණය මගින් වත්මන් ශ්‍රී ලංකාවේ විධිමත් නීති අධ්‍යාපනය හැදෑරීමට හැකියාව ඇත්තේ සීමිත පිරිසකට

පමණක් වුවත් රටක අපරාධ පාලනය හා නිවාරණය උදෙසා එකී තත්ත්වය යෝග්‍ය නොවන බැවින් සමස්ත ප්‍රජාව ම නෛතික සාක්ෂරතාවයෙන් බලගැන්වීම සඳහා පුද්ගලයාගේ සුදුසු ම අවධිය වන්නේ පාසල් අවධිය බව ද මෙහි දී නිගමනය විය. දත්ත දායක මතය අනුව සමස්තයක් ලෙසට විමසා බැලීමේ දී වර්තමානය වන විට පාසල් ළමයින් බහුතරයක් අපරාධ හෝ අපචාර ආදියට යොමුවීමේ ප්‍රවණතාවක් ඇති බවත්, ඔවුන් මෙරට අනාගතය බැවින් ඔවුන් නෛතික සාක්ෂරතාවෙන් බලගැන්වීම සඳහා මෙරට කනිෂ්ඨ ද්විතීයික පාසල් ශිෂ්‍ය අවධිය යෝග්‍ය හා ප්‍රායෝගික වන බව මෙහිදී නිගමනය විය. මැලේසියාව, ලිතුවේනියාව, ඇමෙරිකාව වැනි රාජ්‍යයන් වර්තමානයේ දී නීති අධ්‍යාපනය පාසල මඟින් ලබාදීමට කටයුතු කර ඇති පසුබිමක අපරාධ නීතිය විෂයක් ලෙස පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම තනි හා ප්‍රධාන විෂයයක් ලෙසට එකතු කිරීම සුදුසු වන බව බහුතරයේ මතය විය.

වත්මන් ගුරුභවතුන් හට අපරාධ නීතිය පිළිබඳ දැනුම ලබා දී ඉගැන්වීම් කටයුතුවලට යොදවා ගැනීම හෝ එම විෂය තවදුරටත් ක්‍රමවත් හා විධිමත් අයුරින් ඉගැන්වීම සඳහා ක්ෂේත්‍රය පිළිබඳව මනා අධ්‍යාපන සුදුසුකම් ඇති පිරිස් (නීතිය, අපරාධ විද්‍යා හා අපරාධ යුක්තිය පිළිබඳ උපාධිධාරීන් වැනි) ගුරු සේවයට බඳවා ගැනීම යෝග්‍ය වන බව මෙහිදී පැහැදිලි විය.

අපරාධ නීතිය විෂයයක් ලෙස ඉගැන්වීමේ දී වඩාත් ඵලදායි ලෙස ඉගෙනුම් ඵල සපුරා ගැනීමට පෙළපොත භාවිතයට අමතරව ප්‍රායෝගිකව දැනුම ලබාදීමෙහිලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ සම්පත් දායකත්වයෙන් ළමයින් වෙත ගුණාත්මක අයුරින් දැනුම හා ප්‍රායෝගික අත්දැකීම් සම්ප්‍රේෂණය කළ යුතු බැව් මෙහිදී නිගමනය විය. ඒ සඳහා දැනට ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ප්‍රතිපත්ති යාවත්කාලීන කරමින් අපරාධ නීතිය පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම උදෙසා පහත යෝජනාවන් සිදුකළ හැකිය.

විශේෂඥ කමිටුවක් පත්කර නිර්දේශ ලබාගනිමින් මෙරට කනිෂ්ඨ ද්විතීයික පාසල් ශිෂ්‍ය අවධියේ දී සාධනය කර ගැනීමට අපේක්ෂිත ඉගෙනුම් ඵල හඳුනාගැනීම හා කාලානුරූපීව යාවත්කාලීන කිරීම සුදුසු වන්නේය. අපරාධ නීතිය විෂයක් ලෙස සැලසුම් කිරීමේ දී පහත සඳහන් කරුණු ඇතුළත්ව අදාළ විෂය නිර්දේශයන් සකස් කළ හැකිය.

- අපරාධය, අපරාධයක සම්පාදක ධාතු, අපරාධකරු සහ අපරාධ වින්දිතයා, අපරාධ යුක්ති ක්‍රියා පටිපාටිය හා අදාළ ආයතන පිළිබඳව දැක්වීම.
- බාල අපරාධවල දී අධිකරණ කටයුතු සඳහා ක්‍රියාත්මක වන 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත හා 1944 අංක 42 දරන පරිවාස ආඥා පනත පිළිබඳවත් කරුණු ඇතුළත් කිරීම සුදුසු වේ.
- මෙරට දණ්ඩ නීති සංග්‍රහයේ දැක්වෙන බල අපරාධ 26 පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් සුළු හා බල අපරාධ වර්ග කිරීම හා සෑම අපරාධයකටම වන දඬුවම පිළිබඳව කරුණු ඇතුළත් කිරීම සුදුසු වේ.
- අපරාධමය අවස්ථාවක හා අපරාධයන්ගෙන් ආරක්ෂා වීමට එදිනෙදා ජීවිතයේ දී ගතයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳව කරුණු ඇතුළත් කිරීම.

මෙම විෂය හඳුන්වා දීමේ දී එය නව අත්දැකීමක් වන බැවින් දැඩි අධීක්ෂණයක් ඔස්සේ සිසු සිසුවියන්ගේ අවධානය යොමු කරවීම වැදගත් වන්නේය. විෂය ඉගැන්වීම සඳහා වත්මන් ගුරුවරුන් යොදා ගැනීමේ දී ඔවුනට විෂය පිළිබඳව වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීමට කටයුතු කිරීම. ඉතා ගුණාත්මක අයුරින් විෂය කරුණු ඉගැන්වීම සඳහා නීතිය පිළිබඳව, අපරාධ විද්‍යාව හා අපරාධ යුක්තිය පිළිබඳව වන උපාධිධාරීන් ගුරු සේවයට බඳවා ගැනීම සුදුසු වේ. එහි දී වෘත්තීන් හී නියැලෙන නීතිවේදීන් හා නීතිය පිළිබඳව දැනුම ඇති උපාධිධාරීන් කෙටි කාලසීමාවකට හෝ මෙරට පාසල්වලට අනුයුක්ත කරමින් නීතිය පිළිබඳ දැනුම ලබාදීමට හැකිය. ඒ සඳහා පාසල් පවත්වනු ලබන පාසල් වාර තුනෙන් එකක් යෝජනා කරගත හැකිය. ඒ අනුව එම කාලසීමාව තුළ ශිෂ්‍ය ප්‍රජාව වෙත නීති අධ්‍යාපනයට අදාළ විශේෂ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම සිදුකළ හැකිය.

සියලු ම විෂය කරුණු හැකි සෑම විටෙකම ප්‍රායෝගික ක්‍රමවේද ඔස්සේ ශිෂ්‍ය මනසට ළඟා කරවීම යෝග්‍ය වන නිසාවෙන් ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා, වැඩමුළු සංවිධානය කිරීම වැදගත් වන්නේ ය. නිසි සම්බන්ධීකරණ වැඩපිළිවෙළක් ඔස්සේ ක්ෂේත්‍රයේ විශේෂඥයින් වන පොලිස් නිලධාරීන්, නීතිඥයින්, අපරාධ විමර්ශකයින්, අධිකරණ වෛද්‍යවරුන්, ළමා ආරක්ෂණ නිලධාරීන්, බන්ධනාගාර නිලධාරීන්, සුරාබදු නිලධාරීන්, මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන නිලධාරීන් යනාදීන්ගේ සම්පත් දායකත්වය ලබාගැනීම ද යෝග්‍ය වන්නේ ය. මෙවැනි යෝජනාවන් ක්‍රියාවට නැංවීම තුළින් අපරාධ නීතිය පිළිබඳ දැනුම පාසල් අධ්‍යාපනය හරහා සමාජගත කරවීමට හැකි වන්නේ ය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


අතුකෝරාල, ඩී. ආර්., සහ අතුකෝරාල, එච්. එන්. (2005). *අධ්‍යාපන මනෝවිද්‍යාව හා ගුරුවරයා.* පානදුර. ශික්ෂා මන්දිර ප්‍රකාශක.

ජයවීර, ඒ. එම්. එස්. (1999). *විෂයමාලා සංවර්ධනයට ප්‍රවේශයක්.* මහරගම, තරංජි ප්‍රින්ට්ස්.

වල්පොල, ඒ. එස්. (2013). *චින්තනධාරා.* නුගේගොඩ, දර්ශනය හා මනෝවිද්‍යා සංගමය-ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

වීරතුංග, එන්. (1981). *අධ්‍යාපන මූලධර්ම අධ්‍යාපන නීතිය හා පරිපාලනය.* වැල්ලම්පිටිය, චරක මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

සේනාරත්න, එච්. ඩී. කේ. (2020). *නොවිධිමත් අධ්‍යාපනය විධිමත් කරමු.* දිනමිණ පුවත්පත, කොළඹ, ලේක්හවුස්, Retrieved from https://www.dinamina.lk/2016/10/21/ 24129 Accessed on 2020/ 06/ 28.

හරිස්චන්ද්‍ර, ආර්. (2013). *ශ්‍රී ලංකාවේ නීතිය.* මීගමුව, අකුර ප්‍රකාශකයෝ.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා. (2016). *විෂයමාලා සංවර්ධනය.* නුගේගොඩ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව.

ලෝක බැංකු ආධාර යටතේ, *සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය - 2. (1999). විෂයමාලා ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි සැලැස්මඃ සංශෝධිත වාර්තාව.* මහරගම. ජාතික අධ්‍යාපන ආයතනය.

*සමාජ විද්‍යා ශබ්ද කෝෂය.* (1966). කොළඹ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

Bruce, S and Yearley, S. (2006). *The SAGE Dictionary of Sociology*. London, SAGE Publications.

Canadian Bar Association. (1992). Reading the Legal World: Literacy and Justice in Canada*. Report of the Canadian Bar Association Task Force on Legal Literacy*. Ottawa, Canadian Bar Association.

Chiao, V. (2016). WHAT IS THE CRIMINAL LAW FOR. *Law and Philosophy*, *35*(2), (pp.137–163). Retrieved from http://www.jstor.org/stable/44980957.

Decker, J. R. (2014). Legal Literacy in Education: An Ideal Time to Increase Research, Advocacy, and Action. *Leadership Preparation for School projects, 304 Ed. Law Rep. 679* (pp. 01-20). Retrieved from Indiana: https://www.researchgate.net/publication/286459177 Accessed on 2021/03/20.

Durkheim, É. (1895/1983). *Crime and social health (A. Scull, Trans). In S. Lukes & A. Scull* (Eds.), *Durkheim and the law*.Oxford, UK: Martin Robertson.

Economides, K. (2015). Legal Education. In: Wright, J.D. (eds.) *International Encyclopedia of the Social & Behavioral Sciences, 2nd edition, Vol (13)* pp. 734–739.

Gee, E.G., & Jackson, D.W. (1982). Current Studies of Legal Education: Findings and Recommendations. *Journal of Legal Education, Vol. 32 (*4) pp. 471-505.

Gottschalk P., Gunnesdal L. (2018). *Tip of the Crime Iceberg. In: White-Collar Crime in the Shadow Economy.* Palgrave Pivot, Cham. https://doi.org/10.1007/978-3-319-75292-1_3.

Joninia, E.W., & Petrauskienė, L. (2013). The Role of Legal Education in Development of Students Personal Competences: Conceptions of 10–12 Grade Students and School Staff. Socialinis Darbas. *Social Work, Vol. 12(1)* pp. 93–108.

Kashyap, A.K. (2016). Professional Legal Education in India: Challenges and the Way Forward. Educational Quest*. An International Jouirnal of Education and Applied Social Sciences, Vol 7(3)* pp.141 - 147. India: Retrieved from http://www.ndpublisher.in.lk Accessed on 2021/04/14.

Lakshminath, A. (2008). Legal Education, Research and Pedagogy - Ideological Perceptions*. Journal of the Indian Law Institute, Vol. 50 (4*) pp. 606-628.

Maxwell, R.C., Henning, J.F., & White, C.J. (1975*).* Law Studies in the Schools. *Journal of Legal Education, 1975, Vol. 27 (2)* pp. 157-167.

Rajamanickam, R., Naaim, M.S.M., Zainudin, T.N.A.T., & Dahlan, N.K. (2019). Introduction of Criminal Law as a Subject in National Secondary Schools. *Journal of Educational and Social Research, Vol 9 (3)* pp. 32-38. Retrieved

fromhttps://www.researchgate.net/publication/336068301 Accessed on 2021/04/19.

Rooij, B.V. (2020). Do people know the law? Empirical evidence about legal knowledge and its implications for compliance. *Legal Studies Research Paper Series (20)* pp. 01-24.

Sutherland & Cressey, 1960, *Principles of Criminology*, 6th ed., Philadelphia: Lippencott.

Tripathi, P.K. (1968). In the Quest for Better Legal Education. *Journal of the Indian Law Institute, Vol. 10(3)* pp. 469-491.

White, J. B. (2002). Legal Knowledge. *Harvard Law Review, Vol. 115 (5)* pp.1396 - 1431.

Police Annual Report, (2015 - 2020), www.police.lk. https://www.police.lk/index.php/item/138

Prison Annual report, (2016 - 2020), www.prison.lk. http://prisons.gov.lk/web/.

.